**මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීම සඳහා ඕස්ට්‍රේලියාව, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සමඟ සබඳතා ශක්තිමත් කර ගනී**

ඕස්ට්‍රේලියානු දේශසීමා බලකායේ (Australian Border Force) විශාලතම මුරසංචාරක යාත්‍රාව වන *ඕෂන් ෂීල්ඩ්* (*Ocean Shield*) 2017 මැයි මාසයේදී ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ වරායවල නිල සංචාරවල යෙදිණි. ඕස්ට්‍රේලියානු දේශසීමා බලකායේ (Australian Border Force) නාවිකයෝ ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ඉන්දීය වෙරළාරක්ෂකයන් සමඟ දැනුම හුවමාරු කරගත් අතර මෙහෙයුම් ක්‍රියාකාරකම්වල නිරත විය.

මෙම සංචාර වැදගත්වන්නේ කුමන හේතුවක් නිසාද යන්න ඕස්ට්‍රේලියානු ස්වාධිපත්‍ය දේශසීමා මෙහෙයුමේ (Operation Sovereign Borders) අණදෙන නිලධාරී එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Stephen Osborne පැහැදිලි කර දෙන ලදී.

"මිනිස් ජාවාරම ගෝලීය ගැටලුවකි. අපගේ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ එක්ව කටයුතු කිරීම මගින්, මෙම අපරාධකරුවන්ව පරාජය කර මිනිස් ජීවිත ආරක්ෂාකර ගැනීමට උපකාර කරනු ඇත," යනුවෙන් ඔහු පැවසීය.

එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Stephen Osborne පැවසුයේ කාර්යක්ෂම ජාත්‍යන්තර සහයෝගීතාව සහ තොරතුරු බෙදාහදා ගැනීම මගින් මිනිස් ජාවාරම් බෝට්ටු නැවැත්වීමට ඕස්ට්‍රේලියාව සතු හැකියාව වැඩි කර ඇති බවයි.

"මෙම වසර ආරම්භයේදී ඕස්ට්‍රේලියාව මගින් ශ්‍රී ලාංකිකයන් 25 දෙනෙකු රැගෙන යන මිනිස් ජාවාරම් බෝට්ටුවක් අතර මගදී අල්ලා ගන්නා ලදී. ශ්‍රී ලාංකීය අධිකාරීන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතුකර එම යාත්‍රාවේ සිටි පුද්ගලයන් 25 දෙනාම නැවත ශ්‍රී ලංකාවට පිටත්කර යවන ලදී."

අවසාන මිනිස් ජාවාරම් බෝට්ටුව ඕස්ට්‍රේලියානු වෙරළ වෙත පැමිණ දින 1000 කට වඩා කල් ඉකුත්ව ගොස් ඇති අතර, මිනිස් ජාවාරම හේතුවෙන් මුහුදේ දැනගෙන සිදුවූ අවසාන මරණය සිදුවී වසර තුනකට වඩා කල් ඉකුත්ව ඇත.

ඕස්ට්‍රේලියාව සහ එහි ජාත්‍යන්තර පාර්ශවකරුවන් විසින් මිනිස් ජාවාරමට එරෙහිව කරන සටනේ ප්‍රගතියක් තිබුණද, අපගේ කලාපය පුරා මිනිස් ජාවාරම්කරුවන් විසින් ගොදුරු විය හැකි මිනිසුන් හට සිය මුදල් ලබාදී නීති විරෝධී ලෙස ඕස්ට්‍රේලියාවට යාමට උත්සාහ කරන ලෙස එත්තු ගන්වමින් සිටී.

එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Stephen Osborne ශ්‍රී ලාංකීය - ඕස්ට්‍රේලියානු ප්‍රජා සාමාජිකයන් හට උනන්දු කරනුයේ සිය මුදල් අපතේ යවා නීති විරෝධී ලෙස සිය ජීවිත අවදානමට ලක් කර නොගන්නා ලෙස සිය නෑයන් හට පවසන ලෙසයි.

"නීතිවිරෝධී ලෙස බෝට්ටුවෙන් ඕස්ට්‍රේලියාවට එමට උත්සාහ කිරීම අන්තරායකාරී මෙන්ම අර්ථ විරහිතය. ඕස්ට්‍රේලියාව වෙත පැමිණීමට උත්සාහ කරන ඕනෑම මිනිස් ජාවාරම් බෝට්ටුවක් නවතා හරවා යවනු ඇත. ඕස්ට්‍රේලියාවට එමට ඇති නීතිවිරෝධී මාර්ගය වසා ඇති අතර එය එසේ දිගටම වසා තබනු ඇත."

වැඩිදුර විස්තර සඳහා www.osb.border.gov.au වෙත පිවිසෙන්න.

1 – ඕෂන් ෂීල්ඩ්හි අණදෙන නිලධාරී (Commanding Officer of Ocean Shield) Alan Champkin ශ්‍රී ලංකා නාවික හමුදාවේ නැගෙනහිර පළාතේ අණදෙන නිලධාරී (Eastern Commander) රියර් අද්මිරාල් (RADM) Travis Sinnah කැටුව ඕෂන් ෂීල්ඩ් (Ocean Shield) පෙන්වීමට යයි

2 – ආරක්ෂක නිලධාරී (Officer of the Guard), ලුතිනන් PJ Bakelmun විසින් ඕෂන් ෂීල්ඩ්හි අණදෙන නිලධාරී (Commanding Officer of Ocean Shield), සුපිරින්ටෙන්ඩන්ට් Alan Champkin ව ශ්‍රී ලංකාව වෙත පිලිගනී